## සංක්ෂිප්තය

මෙම අධ්‍යයනය ශ්‍රී ලංකාවේ පාසල්වල ක්‍රියාත්මක වන අභ්‍යන්තර අධීක්ෂණ සංවිධානයේ කාර්යක්ෂමතාව විමසා බැලීම සඳහා සිදු කරන ලද අධ්‍යයනයකි. ඒ අනුව ප්‍රධාන අරමුණු පහක් යටතේ මෙම අධ්‍යයනය සිදු කරන ලදි. එනම් අභ්‍යන්තර අධීක්ෂණය ක්‍රියාත්මක වන සංවිධාන ව්‍යුහයේ ස්වරූපය විමසා බැලීම, එහි කාර්යභාරය හා වගකීම් විමසා බැලීම, එම කාර්යභාරය හා වගකීම් ක්‍රියාත්මක වන මට්ටම විමසා බැලීම, අධීක්ෂණ ක්‍රියාවලියේ දි අධීක්ෂකයින් මුහුණ දෙන ගැටලු හා අභියෝග විමසා බැලීම, අධීක්ෂණ ක්‍රියාවලිය මගින් ගුරු වෘත්තීය සංවර්ධනයට ගෙන ඇති ක්‍රියා මාර්ග විමසා බැලීම එම ප්‍රධාන අරමුණු විය.

ඒ අනුව පළමු පරිච්ඡේදයේ දි අධ්‍යයන ගැටලුව හඳුන්වා, අධ්‍යයන ගැටලුවට අදාළ පසුබිම ද සවිස්තරාත්මකව විස්තර කෙරිණි. එහිදි ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව වර්ධනයටත් ගුරු වෘත්තීය සංවර්ධනය සඳහාත් අභ්‍යන්තර අධීක්ෂණ ක්‍රියාවලියේ අවශ්‍යතාවය හා වැදගත්කම තහවුරු කෙරිණි. මීට අමතරව මෙම පරිච්ඡේදයේ දි අධ්‍යයනයේ වැදගත්කම පිළිබඳව ද, අධ්‍යයන මාතෘකාවට අදාළ පද සංකල්ප අර්ථ කථනය කිරීම ද සිදු කළ අතර අධ්‍යයනයේ සැලැස්ම පිළිබඳව ද විස්තර කෙරිණි.

දෙවන පරිච්ඡේදයේ දි අධ්‍යයනයට අදාළ සාහිත්‍ය විමර්ශනය සිද කරන ලදි. එහි දි **න්‍යායාත්මක සාහිත්‍ය විමර්ශනය** හා **පර්යේෂණ සාහිත්‍ය විමර්ශනය** වශයෙන් ප්‍රධාන තේමා දෙකක් යටතේ එය සිදු කළ අතර, න්‍යායාත්මක සාහිත්‍ය විමර්ශනයේ දි අධීක්ෂණ සංකල්පය, එහි ඓතිහාසික සංවර්ධනය, අධීක්ෂණ භූමිකාව, අධීක්ෂණයේ අවශ්‍යතාව හා වැදගත්කම පිළිබඳව සුවිශේෂිව තොරතුරු විමර්ශනය කළ අතර, පර්යේෂණ සාහිත්‍ය විමර්ශනයේ දි පර්යේෂකයාට ලඟා විය හැකි විදේශිය හා දේශිය වශයෙන් මෙකී ක්ෂේත්‍රට අදාළ පර්යේෂණ තෙරතුරු සමහරක් ඉදිරිපත් කරන ලදි. විදේශිය පර්යේෂණ සාහිත්‍ය ගත් විට පාසල තුළ ඉහළ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සඳහාත්, ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව වර්ධනයටත් ගුරු වෘත්තීය සංවර්ධනය සඳහාත් අභ්‍යන්තර අධීක්ෂණ ක්‍රියාවලි මහෝපකාරී වී ඇති බවත්, මැනවින් සැලසුම් නොකිරීම, අධීක්ෂණය පිළිබඳව සෘණ ආකල්ප එකී ක්‍රියාවලියේ පසුගාමී තත්වය ට හේතුවී ඇති බවත් අනාවරණය කොට ඇත.

මීට අමතරව දේශිය පර්යේෂණ සාහිත්‍ය ගත් විට බෝහෝ පර්යේෂණ මගින් අසංවිධානාත්මක, දුර්වල සම්බන්ධීකරණය සහිත අධීක්ෂණ ක්‍රියාවලිය, අධීක්ෂණ ක්‍රියාවලිය සඳහා පුහුණුවලත් හා සුදුසුකම්ලත් අයගේ ඌනතාව, අධීක්ෂණ ක්‍රියාවලිය සම්බන්ධයෙන් අධීක්ෂක අධීක්ෂිත යන පාර්ශව දෙකෙහිම සුභවාදි හා ධානාත්මක ආකල්පයක් ඇති වී නොතිබීම වැනි පොදු දුර්වලතා සමහරක් අනාවරණය කොට ඇති අතර සෑම පර්යේෂණයක්

තුළින්ම අධීක්ෂණ ක්‍රියාවලියේ වැඩි දියුණුව සඳහා සංවර්ධනාත්මක යෝජනා ද ඉදිරිපත් කොට ඇත.

තුන් වන පරිච්ඡේදයේ දි අධ්‍යයනයට අදාළ අධ්‍යයන ක්‍රමවේදය පිළිබඳව සවිස්තරත්මකව තොරතුරු ඉදිරිපත් කරන ලදි. ඒ අනුව මෙම අධ්‍යයනය සඳහා අධ්‍යයන ක්‍රමවේදය වශයෙන් විස්තරාත්මක පර්යේෂණ ප්‍රවේශය යොදා ගත් අතර, ස්ථරගත නියැදිම සහ සහේතුක නියැදිකරණය භාවිතයෙන් නියැදිගත පාසල් සහ අධ්‍යයන නියැදිය තෝරා ගන්නා ලදි. ඒ අනුව පර්යේෂණ දත්ත රැස් කිරීම සඳහා ප්‍රශ්නාවලී, නිරීක්ෂණය සහ සම්මුඛ සාකච්ඡා යන වලංගු දත්ත රැස් කිරීමේ උපකරණ යොදා ගන්නා ලදි. පර්යේෂණ උපකරණවල වලංගුතාව හා විශ්වාස්‍යතාව ආරක්ෂා කර ගැනිම සඳහා ජ්‍යෙෂ්ඨ අධයාපනඥයින්ට ඉදිරිපත් කරන ලද අතරම නියාමක පරික්ෂණයකට ද භාජනය කෙරිණි. ඒ අනුව සකස් කර ගත් අවසාන පර්යේෂණ උපකරණ මගින් දත්ත රැස් කරන ආකාරයත් එසේ ලබා ගන්නා දත්ත විශ්ලේෂණය කරන ආකාරය පිළිබඳවත් මෙම පරිච්ඡේදයේ දි විස්තර කරන ලද අතර පරයේෂණයේ සීමා ද දක්වන ලදි.

හතරවන පරිච්ඡේදයේ දි දත්ත ඉදිරිපත් කිරීම, විශ්ලේෂණය හා අර්ථ කථනය කිරීම සිදු කරන ලදි. විශේෂයෙන්ම දත්ත විශ්ලේෂණය ප්‍රධාන කොටස් දෙකක් යටතේ සිදු කරන ලද අතර පළමු කොටසින් නියැදියේ පසුබිම් තොරතුරු විශ්ලේෂණය කරන ලද අතර දෙවන කොටසින් අධ්‍යයන අරමුණු අනුව දත්ත විශ්ලේෂණය සිදු කරන ලදි. විදුහල්පතිවරුන්ගේ විශාල ප්‍රතිශතයක් ඉහළ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සැපිරු අය වු අතර, නියෝජ්‍ය විදුහල්පතිවරුන්ගෙන් විශාල ප්‍රතිශතයක් ශ්‍රේණියක් නොමැති වැඩබලන පදනම් යටතේ රාජකාරි ඉටු කරන අය වු අතරම, අධ්‍යාපන කළමනාකරණ ක්ෂේත්‍රයේ පුහුණුවක් ලැබුවන් අවම ප්‍රමාණයක් විය. ගුරු නියැදියෙන් ඉහළ ප්‍රතිශතයක් වෘත්තීය සුදුසුකම් සැපිරු අය විය.

නියැදිගත පාසල් බහුතරයක විදුහල්පතිවරයගේ නායකත්වයෙන් යුතුව පිළිගත් අධීක්ෂණ ක්‍රියාවලියක් හා වැඩසැලස්මක් ක්‍රීයාත්මක වන අතර ඒ අනුව විදුහල්පති කේන්ද්‍රීය අභ්‍යන්තර අධීක්ෂණ ක්‍රියාවලිය සැළකිය යුතු තරම් කාර්යක්ෂම මට්ටමකින් ක්‍රියාත්මක වන බවද නියොජ්‍ය විදුහල්පති, අංශ ප්‍රධාන සහ විෂය ප්‍රධාන අධීක්ෂණ කාර්යභාරය හා වගකීම් තුන වර්ගයේ පාසල් ස්ථරවලට වඩා අනෙක් පාසල් ස්ථර තුනෙහි කාර්යක්ෂම අයුරින් ඉටු වන බව අනාවරණය විය. එහෙත් සමස්තයක් වශයෙන් අධීක්ෂණය පිළිබඳ විධිමත් පුහුණුවක් ඔවුනට අවශ්‍ය වේ. පාසල් අභ්‍යන්තර අධීක්ෂණ ක්‍රියාවලියේ පවත්නා මට්ටම පිළිබඳ ගුරු ප්‍රතිචාර විමර්ශනය කරන විට බහුතරයක් ගුරුවරුන් තුළ සතුටු දායක මට්ටමක් පවතින බව අනාවරණය වු අතර අධීක්ෂකයින් තෝරා ගැනීම, ඔවුන්ගේ සුදුසුකම් හා නිපුණතා ද ඇගයීම්

ක්‍රම හා ප්‍රතිපෝෂණ ක්‍රියා මාර්ග ගත් විට ඒවා එතරම් සතුටු දායක මට්ටමක් නොපවතින බව අනාවරණය විය.

අභ්‍යන්තර අධීක්ෂණ ක්‍රියාවලිය සම්බන්ධ පුහුණු මානව සම්පත් ඌනතාව, විශේෂයෙන් ම විදුහල්පතිවරුන්ට දෛනික පරිපාලන කාර්යයන් බහුලවීම හේතුවෙන් අධීක්ෂණ ක්‍රියාවලියට බාධා ඇති වීම, අධීක්ෂණ ක්‍රියාවලිය සම්බන්ධ ඇතැම් ගුරුවරු අසුභවාදි සෘණ ආකල්ප දැරීම, ඉගෙනුම් ද්‍රව්‍ය ඇතුළු සම්පත් ඌනාතව ආදි ගැටලු හා බාධක පාසල් මට්ටමේ අභ්‍යන්තර අධීක්ෂණ ක්‍රියාවලියේ දි පොදුවේ අධීක්ෂකයින් මුහුණ දෙන ගැටලු බව දත්ත විශ්ලේෂණය තුළින් අනාවරණය විය.

සේවාස්ථ පුහුණු වැඩමුළු සහ සේවාස්ථ සැසි සඳහා යොමු කරවීම, ගුරු ගැටලු සාමුහිකව විසඳිම, වෘත්තීය සංවර්ධන පාඨමාලා සඳහා යොමු කරවිම වැනි ක්‍රියා මාර්ග අභ්‍යන්තර අධීක්ෂණ ක්‍රියාවලිය පදනම් කර ගනිමින් ගුරු වෘත්තීය සංවර්ධනය සඳහා පොදුවේ ගනු ලබන ක්‍රියා මාර්ග ලෙස අනාවරණය වු අතර, එහෙත් ගුරු වෘත්තීය සංවර්ධනය සඳහා උක්ත ක්‍රියා මාර්ග හැරෙන්නට කිසිදු පාසලක පාසල් පාදක වෘත්තීය සංවර්ධන වැඩ සටහනක් හෝ වෘත්තීය පෝෂණ වැඩසටහනක් සාර්ථකව සහ යාවත් කාලීනව පවත්වා ගෙන නොයන බව අනාවරණය විය.

පස්වන පරිච්ඡේදයේ දි දත්ත විශ්ලේෂණය තුළින් අනාවරණය කරගත් තොරතුරු හෙවත් නිගමන සඳහන් කෙරිණි. එමෙන්ම පාසල් මට්ටමේ අභ්‍යන්තර අධීක්ෂණ ක්‍රියාවලිය තව දුරටත් කාර්යක්ෂම හා ඵලදායි අයුරින් පවත්වා ගෙන යෑම සඳහා අවශ්‍ය කරන සංවර්ධනාත්මක යෝජනා ද, කිසියම් පර්යේෂකයෙකුට අනාගතයේ දි තවදුරටත් මෙම ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වැඩි දුර අධ්‍යයනයක් කිරීමට අවශ්‍ය වන පෙළඹුමක් ඇති කරවන ආකාරයේ අනාගත පර්යේෂණ යෝජනා කිහිපයක් ද ඉදිරිපත් කරන ලදි.